# මායිම් ගම්මානවල විහාරස්ථාන නංවන වැඩ පිළිවෙළක් එයි

(රන්ජිත් ආනන්ද ජයසිංහ)



උතුරු - නැගෙනහිර කොටි ගැටුම් නිසා දැඩි ලෙස බැටකෑ "මායිම්" ගම්මානවල විහාරස්ථාන සංවර්ධනය සඳහා නව වැඩ පිළිවෙළක් ආරම්භ කිරීමට යයි.

ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතා සහ ජනාධිපති ජ්‍යෙෂ්ඨ උපදේශක මිලින්ද මොරගොඩ මහතා එක්ව මෙම වැඩසටහන සංවිධානය **13 වැනි පිටුවට...**

## මායිම් ගම්මානවල විහාරස්ථාන...

කෙරෙන බව රජයේ ආරංචි මාර්ග කියයි. මේ සඳහා මහා සංඝරත්නයේ උපදෙස් ලබාගැනීම පිණිස ආරක්ෂක ලේකම්වරයා හා මිලින්ද මොරගොඩ මහතාගේ ප්‍රධානත්වයෙන් ත්‍රෛනිකායික ජ්‍යෙෂ්ඨ නාහිමිවරුන් සමග විශේෂ සාකච්ඡාවක් පසුගියදා ආරක්ෂක අමාත්‍යාංශයේදී පැවැත්විණ.

වැඩසටහන සඳහා රාජ්‍ය අරමුදල්වලට අමතරව දෙස් - විදෙස් ආධාර ලබා ගැනීමටද සැලැසුම්කර තිබේ. මෙහි ආරම්භක පියවර ලෙස යුද්ධයට නතුව තිබූ අම්පාර, ත්‍රිකුණාමලය, අනුරාධපුරය, පොලොන්නරුව, වව්නියාව, පුත්තලම ආදී දිස්ත්‍රික්කවල මායිම් ගම්මාන ආශ්‍රිත විහාරස්ථාන ගැන සමීක්ෂණයක් ආරම්භ කෙරේ.

විහාරස්ථාන සංවර්ධනය කිරීමේ කටයුතු සඳහා ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතාගේ අනුග්‍රහයෙන් සිවිල් ආරක්ෂක බළකායේ සහය ලබා ගැනීමටද නියමිතය.